# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 09 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය 17: අකුණු අනතුරු |
|---|---|---|

## I කොටස

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. අකුණු ඇතිවන ආකාරයක් වන්නේ,

(1). වා අකුණු (2). වැසි අකුණු (3). වියළි අකුණු (4). මෝසම් අකුණු

02. ගෘහස්ථ උපකරණ භාවිතයේදී සිදුවන අකුණු සැර වැදීම,

(1). පාර්ශ්වික අකුණුය (2). ස්පර්ශ අකුණුය (3). පියවර අකුණුය (4). ඍජු අකුණුය

03. අකුණුවලින් ආරක්ෂාවීමට හොඳම ස්ථානය වන්නේ,

(1). නිවස තුළය (2). වාහන තුළය (3). ගසක් උඩය (4). ගසක් යටය

04. අකුණු ඇතිවීමට හේතුව නිවැරදිව දක්වා ඇත්තේ,

(1). වලාකුළුවල ස්ථිති විද්‍යුත් ආරෝපණ ඇතිවීමය

(2). වලාකුළු සන්නායක ලෙස ක්‍රියාකිරීමයි

(3). වැසි කාලගුණයක් පැවතීමයි

(4). වලාකුළුවල කුඩා ජල බිඳිති තිබීමයි

05. ආරෝපිත වලාකුළු දෙකක් අතර ඇතිවන අකුණු ................. ලෙස හැඳින්වේ.

(1). පෘථිවි අකුණු (2). ඍජු අකුණු (3). වා අකුණු (4). වලා අකුණු

06. විවෘත ස්ථානයක සිටී නම් අකුණුවලින් ආරක්ෂාවීමට කළයුතු හොඳම දේ වන්නේ,

(1). ගසක් උඩට නැගීම

(2). ගසක් මුලට යෑමයි

(3). දෙපා ආසන්නව තබා පහත් වීමයි

(4). දෙපා ආස්නව තබා උස ස්ථානයක සිටීමයි

07. අකුණ සම්බන්ධව වැරදි වගන්තිය කුමක්ද?

(1). අකුණු සම්බන්ධව අනාවැකි පලකළ නොහැක

(2). අකුණු ඇතිවන කාල වකවානු ඇත

(3). නිවස තුළ සිටියදී වුවද අකුණු අනතුරු සිදුවිය හැක

(4). සෑම වලාකුළකින්ම අකුණු ඇතිවේ

08. අකුණු ඇතිකිරීම සඳහා වැඩි වශයෙන්ම දායක වන්නේ,

(1). කැටි වලාකුළුය (3). පැතලි වලාකුළුය

(2). ස්ථර වලාකුළුය (4). සෑම වලාකුළු වර්ගයක්ම

EXAMRESULTS.LK

09. අකුණු අනතුරු සම්බන්ධ අසත්‍ය වගන්තිය වන්නේ, අකුණු පරිසරයකදී

(1). රැහැන් සහිත දුරකථන භාවිතය නොකළ යුතුය

(2). ඇඳක දිගාවී සිටීම සුදුසුය

(3). අකුණු අනතුරුවලට ලක්වූවකු අතින් නොඇල්ලිය යුතුය

(4). අනතුරු වූවෙකුට කෘත්‍රිම ශ්වසනය දීම සුදුසුය

10. ශ්‍රී ලංකාවේ අකුණු ක්‍රියාකාරිත්වය බහුල කාල සීමාවකි.

(1). ජනවාරි - පෙබරවාරි

(2). මාර්තු - අප්‍රේල්

(3). මැයි - ජුනි

(4). ජූලි - අගෝස්තු

## II කොටස

01.




i. අකුණක් ඇතිවන්නේ කෙසේද?

ii. වලාකුළු ආරෝපණය වන්නේ කෙසේද?

iii. විද්‍යුත් විසර්ජනය සිදුවන ආකාරය අනුව ප්‍රධාන අකුණු වර්ග 3 නම් කරන්න.

iv. රූප සටහනේ A, B, C, D ලෙස දක්වා ඇති අකුණු වර්ග නම් කරන්න.

v. භූගත වන ආකාරය අනුව ප්‍රධාන අකුණු වර්ග 3 නම් කරන්න.

vi. අකුණු අනතුරු අධික කාල සීමාවන් මොනවාද?

vii. උස් ගොඩනැගිල්ලක් අකුණු අනතුරුවලින් ආරක්ෂා කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් නම් කරන්න.

viii. අකුණු ඇතිවිය හැකි අවස්ථාවක අනුගමනය කළ යුතු ආරක්ෂක පිළිවෙත් 3ක් සඳහන් කරන්න.

02. ආරෝපිත වලාකුළක් පහත දැක්වේ.




i. a හා b වල ඇති ආරෝපණ වර්ග වෙන වෙනම ලියන්න.

ii. වලාකුළෙහි සිට ආරෝපණ පැනීම සිදුවන ස්ථානය අනුව වියහැකි අකුණු වර්ග 3 නම් කරන්න.

iii. ඉහත අකුණුවලින් වඩාත් හානිකර අකුණු වර්ගය කුමක්ද?

iv. පෘථිවි අකුණක් ඇතිවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

v. පෘථිවි අකුණක වෝල්ටීයතාවය කොපමණද?

vi. අකුණකදී ගිගිරුම් හඬ ඇතිවන්නේ කෙසේද?

vii. අකුණකදී පළමුව සංවේදනය වන්නේ කුමක්ද?

03. මිනිසුන්ට, සතුන්ට හා ගොඩනැගිලිවලට හානි කරන ආකාරයට අකුණු භූගතවන ආකාරය පහත දක්වේ.



P Q R

i. P, Q, R නම් කරන්න.

ii. පහත එක් එක් අවස්ථාවට අදාළ අකුණු වර්ගය කුමක්ද?

a). ගසක කඳට අත තබා සිටින අවස්ථාවක අකුණු වැදීම.

b). උස් ගොඩනැගිල්ලක් අසල සිටින අයෙකුට අකුණු වැදීම.

c). පිට්ටනියක සිටින පුද්ගලයෙකුට අකුණක් වැදීම.

iii. අකුණු අනතුරක් වළක්වා ගැනීමට අනුගමනය කළ යුතු පූර්වෝපායන් 2ක් ලියන්න.

iv. අකුණකින් ආරක්‍ෂා වීමට හොඳම ස්ථානය කුමක්ද?

v. අකුණු සන්නායකයක ක්‍රියාව කෙටියෙන් විස්තර කරන්න.

vi. අකුණු සන්නායකය නිර්මාණය කළ විද්‍යාඥයා නම් කරන්න.